ස්වදේශ කටයුතු චක්‍රලේඛ : 10/2020

මගේ අංකය -HAF/01/02/HD/2019/(කා.ව)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිල මැඳුර,
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.
2020.03. 15

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සියලුම සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියලුම ග්‍රාම නිලධාරින්.

**<u>කොරෝනා වෛරසය ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීම</u>**

ශ්‍රී ලංකාව තුළින් සැලකිය යුතු කොරෝනා ආසාධිත රෝගීන් සංඛ්‍යාවක් හමුවී ඇති නිසා මෙම රෝග තත්ත්වය වසංගත තත්ත්වයක් දක්වා වර්ධනය වීම වළක්වනු පිණිස කටයුතු කිරීම සියලුම රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පෞද්ගලික අංශයේ ආයතනවල මෙන්ම මහජනතාවගේද වගකීම වේ.

02.ඒ අනුව මෙම තත්ත්වය තවදුරටත් ව්‍යාප්ත වීම වළක්වා ගනු පිණිස පහත සඳහන් ක්‍රියාමාර්ගයන් අනුගමනය කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටින අතර, ඒ අනුව මෙම අමාත්‍යාංශය විසින් සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්, දිසාපතිවරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත උපදෙස් ලබාදෙනු ඇත. මෙම කොරෝනා රෝග තත්ත්වය පාලනය කිරීමට පත්කර ඇති කොරෝනා මර්දන කාර්ය සාධක බළකාය බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාර විශේෂඥ වෛද්‍ය සීතා අරඹේපොල මැතිතුමියගේ ප්‍රධානත්වයෙන් මේ වනවිට අංක 1090, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය යන ස්ථානයේ ස්ථාපිත කර ඇත. මෙම කාර්ය සාධක බළකාය වෙත තොරතුරු ලබාදීමට සහ අවශ්‍ය සහය ලබාගැනීමට 117 දුරකථනය ඔස්සේ සම්බන්ධ වන ලෙස දැනුම් දෙමි.

03. මීට සමගාමීව සියලුම දිස්ත්‍රික් ලේකම්වරු, ප්‍රාදේශීය ලේකම්වරු, ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් සහය ලබාගෙන තම කාර්යාල තුළ කොරෝනා මර්දන තොරතුරු වාර්තා කරන මධ්‍යස්ථානයක් ආරම්භ කළ යුතුය. මෙම කොරෝනා මර්දන තොරතුරු වාර්තා කරන මධ්‍යස්ථානය වෙත සහය ලබාදෙනු පිණිස අදාළ කාර්යාල අයත්වන පොලිස් ස්ථානාධිපති විසින් එම ඒකකයට සහය පිණිස පොලිස් නිලධාරියෙකු අනුයුක්ත කරනු ලැබිය යුතුය. මේ අනුව ගම් මට්ටමේදී ඒ ඒ ග්‍රාම නිලධාරී වසම භාර ග්‍රාම නිලධාරී, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී, ආර්ථික සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී සියලු දෙනාගේ සහයෝගයෙන් ගම් මට්ටමින් ග්‍රාම නිලධාරී වසමේ පිහිටුවා ඇති ග්‍රාමීය සිවිල් ආරක්ෂක කමිටුව හෝ ග්‍රාමීය ඩෙංගු මර්දන කමිටුව හා එක්ව කටයුතු කොට පහත පරිදි ක්‍රියාකළ යුතුය.

04.ඒ අනුව අදාළ ප්‍රාදේශීය ලේකම් වෙත තොරතුරු ලබාදීම පිණිස ඔබ අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව, සංස්ථා හා මණ්ඩල කාර්යාලවලද කොරෝනා තොරතුරු වාර්තා කරන මධ්‍යස්ථානයක් පිහිටුවන ලෙස දන්වා සිටිමි. ඒ අනුව පහත ක්‍රියා මාර්ග අනුගමනය කරන මෙන් දන්වා සිටිමි.

I. මෙම මධ්‍යස්ථානවලට වාර්තා වන කොරෝනා වෛරසය වැලඳී ඇතැයි සැකසහිත පුද්ගලයින් පිළිබඳව අදාළ සෞඛ්‍ය බලධාරීන් වෙත වාර්තා කිරීම.

II. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් දැනට ස්ථාපිත කර ඇති ප්‍රාදේශීය සිවිල් ආරක්ෂක කමිටුව හෝ ප්‍රාදේශීය ඩෙංගු මර්දන කමිටුව මගින් කොරෝනා රෝග තත්ත්වය පිළිබඳව හා කොරෝනා රෝග මර්දනය පිළිබඳව දැනුවත් කිරීම හා මෙහෙයුම් කටයුතු ආරක්ෂක අංශවලද සහය ලබාගෙන සිදුකිරීම.

III. ග්‍රාමීය මට්ටමේ කොරෝනා වෛරසය වැලඳී ඇතැයි සැකසහිත පුද්ගලයන් වේ නම් ඒ පිළිබඳව ග්‍රාම නිලධාරීන් ඇතුළු ගම් මට්ටමින් ඉහත සඳහන් නිලධාරීන් වෙත වාර්තා කරන ලෙස දන්වා සිටින අතර එම පුද්ගලයන් ආරක්ෂක අංශවල සහය ඇතිව නිරෝධායන කටයුතුවලට යොමුකිරීම.

IV. විදේශගතව සිට පැමිණෙන නිරෝධායන කටයුතු සඳහා යොමුකරනු ලබන පුද්ගලයන් හා ස්වයං නිරෝධායන කටයුතුවලට (තම නිවසේ සිටම) යොමුවන පුද්ගලයන් හට අවශ්‍ය කරන විශේෂ නිවාඩු ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 12:9 හා XXVIII පරිච්ඡේදයේ 13:1:2 වගන්තිය අනුව ලබාදීමට අදාළ අමාත්‍යාංශ ලේකම්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් කටයුතු කළ යුතු වේ.

V. විවිධ රාජකාරි කටයුතු සඳහා රාජ්‍ය ආයතනවලට පැමිණෙන මහජනතාව අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගතයුතු අතර විශේෂයෙන්ම මහජන දිනය වන බදාදා දිනය කාර්යාලවලට පැමිණෙන මහජනතාව අවම කර ගැනීමට දුරකථන, ඊ මේල් වැනි මාධ්‍ය ඔස්සේ මහජන ගැටලු නිරාකරණය කරදීමට කටයුතු කිරීම.

VI. සියලුම රජයේ කාර්යාලවලට පැමිණෙන රාජ්‍ය නිලධාරීන් හා මහජනතාව විෂබීජවලින් ආරක්ෂා කර ගැනීමට විෂබීජානුහරණ අත් සේදීම් දියර හා අත් ආලේපන දියර (Sanitizer) ලබාදීමට කටයුතු කිරීම.

VII. විශාල වශයෙන් රාජ්‍ය නිලධාරීන් හා මහජනතාව එක්රැස් කරවන පුහුණු වැඩසටහන්, රැස්වීම් තාවකාලිකව අත්හිටුවීම.

VIII. මෙම කොරෝනා රෝග තත්ත්වය තවදුරටත් ව්‍යාප්ත වන්නේ නම් රජයේ කාර්යාලවල කටයුතු සීමා කිරීමට සිදුවිය හැකි අතර එහිදී මාණ්ඩලික නිලධාරීන් හා අත්‍යවශ්‍ය සහයක නිලධාරීන් පමණක් කාර්යාල වෙත වාර්තා කිරීම කටයුතු කිරීම තුළින් රෝගී තත්ත්වය පාලනය කළ යුතු අතර ඒ පිළිබඳ තීරණ ගැනීම අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සිදුකළ යුතුය.

IX. කොරෝනා රෝග තත්ත්වය පිළිබඳ කාලීන තොරතුරු අවශ්‍ය වේ නම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වසංගත විද්‍යා රෝග අංශයේ වෙබ් අඩවියෙන් (http://www.epid.gov.lk) ලබාගත හැකිය.

X. කොරෝනා වෛරසයෙන් ආරක්ෂාවීම පිළිබඳව වසංගත විද්‍යා රෝග අංශය විසින් ලබාදී ඇති උපදෙස් මාලාව ඔබගේ වෙබ් අඩවියේ ඇතුළත් කිරීමට හෝ එම වෙබ් අඩවියට ළඟා විය හැකි දිගුවක් (link) ලබාදීමට කටයුතු කරන්න.

05. කුමන තත්ත්වයක් යටතේ වුවද අත්‍යවශ්‍ය මහජන සේවාවන් පවත්වාගෙන යායුතු බැවින් විශේෂිත නිවාඩුවක් ප්‍රකාශයට පත්වුවද ආහාර, ඖෂධ, ජලය, විදුලි, සෞඛ්‍ය සේවා සහ ජාත්‍යන්තර බැංකු සේවාවන් ඇතුළු අත්‍යවශ්‍ය සේවාවන් නිසි පරිදි අඛණ්ඩව පවත්වා ගෙන යාමට අදාළ බලධාරීන් විසින් නිසි පියවර ගත යුතුය.

මෙවැනි ජාතික උවදුරකදී යම් අසත්‍ය ප්‍රචාර පතුරුවන්නන් පිළිබඳව විමසිලිමත්ව කටයුතු කරන ලෙසද, පිළිගත් මූලාශ්‍රවලින් ලද තොරතුරු මත පමණක් කටයුතු කළ යුතු බවද දන්වන අතර මෙම කොරෝනා රෝග උවදුර වළක්වා ගනු පිණිස රජයට අවශ්‍ය සියලු සහයෝගයන් ලබාදීමට කටයුතු කරනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

එස්.හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය